**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 උපස් ගිණුම්කරණ පරිචයන්
-------------------------------

සභාව සතු වෙළෙන්දාව ඉඩමෙහි මෙහෙයුම් ප්‍රතිඵලය දැක්වීම සඳහා වෙනම ගිණුමක් ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභාවට පවරා ගත් ඉඩම් 02 ක වටිනාකම වූ රු.150,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.256,486 ක් වූ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.348,993 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,348,993 ක් වශයෙන් ප්‍රතිපාදන සලසා තිබීමෙන් ණයහිමියන් හා වියදම් රු.1,000,000 කින් වැඩියෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ වැටුප් ප්‍රතිපූර්ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.15,306,102 ක මුදල සියළුම වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩසටහනක් යටතේ දක්වා තිබුණි.

(ඉ) වසර කිහිපයක සිට ගෙවිය යුතු එකතුව රු.254,542 ක මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට නොයවා සභාවේ පොදු අරමුදලෙහි රඳවා ගෙන තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය හා උපකරණ තොගය රු.102,370 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.81,220 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ වියදම රු.21,150 කින් අඩුවෙන් දැක්විණි.

(උ) ඉකුත් වර්ෂයට අදාළ කර්මාන්ත 13 ක් වෙනුවෙන් ප්‍රතිපාදන ලැබී ගෙවීම් නිම කළ ද, සමාලෝචිත වර්ෂයේදීත් ලැබිය යුතු පළාත් සභා ආධාර යටතේ රු.139,097 ක් ලෙස ප්‍රතිපාදන සලසා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියෝ සහ ආදායම් එම ප්‍රමාණයන්ගෙන් වැඩියෙන් දැක්විණි.

(ඌ) කර්මාන්ත 10 ක් වෙනුවෙන් වර්ෂ කිහිපයක සිට ලැබිය යුතු ලෙස පළාත් සභා ආධාර යටතේ රු.1,273,647 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, එම කර්මාන්ත 10 හි ලැබීම් හා ගෙවීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ණයගැතියෝ හා ආදායම් එම ප්‍රමාණයන්ගෙන් වැඩියෙන් දැක්විණි.

(එ) සමාලෝචිත වර්ෂයේ සභා අරමුදලින් ගෙවිය යුතු රු.175,992 ක වටිනාකම වූ කර්මාන්ත 06 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.175,992 කින් අඩුවෙන් දැක්විණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ "දොරින් දොරට - ගමින් ගමට" වැඩසටහනෙහි රු.700,000 ක වටිනාකම වූ කර්මාන්ත 03 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.700,000 කින් අඩුවෙන් දැක්විණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ මග නැගුම වැඩසටහනෙහි වටිනාකම රු.1,526,027 ක් වූ කර්මාන්ත 03 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.1,526,027 කින් අඩුවෙන් දැක්විණි.

(ඕ) විමධ්‍යගත ප්‍රතිපාදන - 2013 යටතේ රු.10,791,610 ක් වූ කර්මාන්ත 03 ක් සඳහා ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයගැතියන් හා ප්‍රාග්ධන ආදායම් සහ ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්විණි.

(ක) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 15 ක් සඳහා ගෙවිය යුතු ආධාර මුදල රු.4,696,988 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.5,221,585 ක් වශයෙන් ප්‍රතිපාදන සලසා තිබීමෙන් රු.524,597 කින් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දැක්විණි.

**1.3.4 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.1,953,667 ක වෙනසක් පැවතුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.110,314,750 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, යාවත්කාලීන කරන ලද ණය ලේඛනය සහ කාල විශ්ලේෂණය, තැන්පතු සහතික, ණයගැති තහවුරු ලිපි පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාලව වර්ෂ 06 කට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.1,220,997 ක ශේෂයක් හඳුනාගෙන පියවීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.7,831,630 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.677,925 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 වරිපනම් බදු**

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව සභා බලප්‍රදේශයේ මාර්ග පද්ධති පහසුකම්, විදුලි පහසුකම්, දුරකථන පහසුකම්, ජල පහසුකම්, ප්‍රාදේශීය සභාව විසින් කැලි කසල ඉවත් කිරීම කරනු ලබන පහසුකම් පවතින දියුණු කළ ප්‍රදේශ ලෙස සැලකිය හැකි යක්කලමුල්ල නගරය වැනි ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 අක්කර බදු**

-------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.215,792 ක අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.3 බදුකුලී**

**-------**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.207,610 ක බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**---------------**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.37,500 ක බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 323,210 ක උසාවි දඩ හා රු. 6,400,790 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.6 කඩ කාමර බදු

------------------

සභාවට අයත් යක්කලමුල්ල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 39 පිළිබඳව 2015 අප්‍රේල් 09 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගිවිසුමේ 08 වන කොන්දේසිය අනුව බදුගත් දේපල අතුරු බදු නොදිය යුතුය යන්න දක්වා ඇතත්, කඩ කාමර 04 ක් අතුරු බදු දී තිබුණි.

(ii) වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 ක් දීර්ඝ කර වීදුරු යොදා බෙදා වෙන්කිරීමක් කර තිබුණ ද, එකී වෙනස්කිරීම් සඳහා සභා අනුමැතිය ලබාගෙන තිබූ බවට සාක්ෂි අනාවරණය නොවීය.

(iii) වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 08 ක් වසාදමා තිබූ අතර කඩ කාමර 03 ක් තොග රැස්කිරීම සඳහා භාවිතා කර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

1988 අංක 74 දරන (සංශෝධිත) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව සභාවේ සියළුම සභිකයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවත්, සභිකයින් 08 දෙනෙකු විසින් 2014 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

**(අ) ට්‍රැක්ටර් සහ යන්ත්‍රෝපකරණ**

----------------------------------

මෙම වැඩසටහන යටතේ සභාවට ලබා දී තිබූ වාහන සම්බන්ධයෙන් 2014 අප්‍රේල් 17 දින සිදුකළ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් ඉදිරිපත් කරන ලද වාහන අවශ්‍යතා ලැයිස්තුවෙන් පරිබාහිරව ලැබී තිබූ කියුබ් 02 ක ධාරිතාවයකින් යුතු ටිපර් රථය විගණන දිනය දක්වා කිසිදු කාර්යයකට යොදවා ගැනීමකින් තොරව සභා භූමියේ ගාල් කර තබා තිබුණි.

(ii) සභාව විසින් ටොන් 05 ක මාර්ග තලනයක් ඉල්ලුම් කර තිබිය දී ටොන් 08 ක මාර්ග තලනයක් ලබා දී තිබුණි. එකී මාර්ග තලනය බලප්‍රදේශයේ මාර්ගයන්හි ධාවනය කල නොහැකි බැවින් සංවර්ධන කාර්යයන්ට යොදවා ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) සභාවට ලබා දී තිබූ ටිපර් රථය, මාර්ග තලනය ජල බවුසරය සහ ට්‍රැක්ටරය යන වාහනවල ලියාපදිංචි සහතික සහ අයිතිය පැවරීමේ ලිපි කිසිවක් සභාවට ලැබී නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය